// # ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2138/42 - 2019 අගෝස්තු මස 30 වැනි සිකුරාදා - 2019.08.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### වයඹ පළත් ගරු ආණ්ඩුකාරතුමා විසින් කරනු ලබන නිවේදනය

1987 අංක 42 දරන පළාත් සභා පනතේ 32(3) වගන්තිය ප්‍රකාරව නිකුත් කරනු ලබන රීති මාලා

වයඹ පළාත් පාසල් කාර්ය සහායකවරුන් සඳහා, 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 32(3) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් රීති මාලාව නිකුත් කරනු ලබන බවත්, 2019.09.01 දින සිට මෙම රීති මාලාව බලාත්මක වන බවත්, මෙයින් නිවේදනය කරමි.

පේශල ජයරත්න බණ්ඩාර,
වයඹ පළාත් ආණ්ඩුකාරවර.

2019 අගෝස්තු මස 26 වැනි දින,

**වයඹ පළාත් පාසල් කාර්ය සහායකවරුන් සඳහා වන කාර්ය රීති මාලාව**

01. පාසල් කාර්ය සහායකවරුන්ගේ පැමිණීමේ වෙලාව පෙ.ව 7.00 හා පිටවීම ප.ව 3.45 විය යුතුය. එසේ වුවද පාසල නිමවීමෙන් පසුව වෙනත් විශේෂ රාජකාරියක යෙදී නැත්නම් පාසලෙන් බැහැර විය හැක.

02. පැය 01 විනාඩි 30 වන කෙටි නිවාඩුව පෙ.ව 7.00 සිට පෙ.ව 8.30 දක්වා හෝ ප.ව 2.15 සිට ප.ව 3.45 දක්වා හෝ රාජකාරියට බාධා නොවන පරිදි දිවා ආහාරයට පෙර හෝ පසුව පැය 01 විනාඩි 30 විය යුතුය.

03. වරු භාග නිවාඩුව පෙ.ව 11.00 දක්වා පැය 04 හෝ පෙ.ව 11.45 සිට පැය 04 ක් හෝ විය යුතුය.

04. අනෙකුත් නිවාඩු සම්බන්ධව ආයතන සංග්‍රහය හා අදාල චක්‍රලේඛ අනුව සිදු විය යුතුය.

1A - PG 4634 — 20 (2019/08)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

05. පාසල් නිමාවෙන් පසුව හෝ පාසල් නිවාඩු දිනයන්හි දී හෝ පාසල් කාර්ය සහායිකාවක් සේවයේ යොදවා ගැනීමේ දී විදුහල්පතිවරයා විසින් අනිවාර්යෙන්ම තවත් සේවිකාවක් හෝ ගුරුවරියක් එම අවස්ථාව සඳහා කැඳවා ගත යුතුය.

06. පාසල් පරිසරයට සුදුසු ලෙස හා විනීත ලෙස සේවක මහතුන් කලිසම හා කමිසයකින් ද මහත්මීන් සාරියකින් ද සැරසී සේවයට වාර්තා කළ යුතුය.

07. කාර්යාලයීය කටයුතුවලට සහායවීම සඳහා විදුහල්පතිවරයා විසින් සේවක මහත්ම මහත්මීන්ට රාජකාරි පැවරීම සිදු කළ යුතුය.

08. පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් සේවක මහත්ම මහත්මීන්ට හැඳුනුම්පත් නිකුත් කිරීම කළ යුතුය.

9 - 471

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.